ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පුනරාවර්තන වියදම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 සැප්තැම්බර් 10 දින සිට 2024 නොවැම්බර් 30 දක්වා වූ කාලයට අදාළව පිරිසිදු කිරීමේ වියදම් ලෙස වැඩිපුර ගෙවන ලද රු.141,055ක මුදල හිලව්කර ගැනීම සඳහා 2024 දෙසැම්බර් මස පිරිසිදු කිරීමේ බිල්පතෙහි වටිනාකම වූ රු.118,181ක් අදාළ වියදම් ගිණුමට අධිභාර කරනු වෙනුවට පොදු තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි.	ගිවිසුමේ පවතින ගැටළු හේතුවෙන් අදාළ මුදල රඳවා තබාගෙන ඇති අතර ගැටළුව නිරාකරණය වූ පසු එම මුදල සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව.	වැඩිපුර ගෙවීම සහ එය පියවා ගැනීම වෙනුවෙන් සිදුකළ රඳවාගැනීම සමාලෝචිත වර්ෂයේදී සිදුකළ ගනුදෙනු බැවින් රඳවාගනු ලැබූ මුදල වියදම් ගිණුමට අධිභාර කළ යුතුය.
(ii)	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පරිහරණය කරනු ලබන කැබ් රථ දෙකට අලුතින් ටයර් 8ක් යෙදීම වෙනුවෙන් වැයකර තිබුණු රු.334,711ක මුදල වාහන නඩත්තු වියදම් ලෙස වැය විෂයය අංක 256-1-1-0-1301 යටතේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත විය යුතු වුවත්, එම වියදම මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ වියදම් ලෙස වැය විෂය අංක 256-1-1-0-2003 යටතේ ගිණුම් ගතකර තිබුණි. ඒ අනුව මූලධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද පුනරාවර්තන වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම්ගත වී තිබුණි.	256-1-1-0-2003 වැය විෂයෙන් ප්‍රතිපාදන ලබාදී ඇති බව සහ මෙම වසරේදී නිවැරදි වැය විෂයෙන් ප්‍රතිපාදන නිදහස් කිරීමට සටහන් කරගන්නා ලද බව.	වියදම් ගිණුම් තැබීමේදී නිවැරදි වැය විෂය අංකය යටතේ ගිණුම් තැබීම සිදුකළ යුතු අතර එය තහවුරු වන අභ්‍යන්තර පාලන පද්ධතියක් නිර්මාණය කළ යුතුය.

(ආ) **මූලධන වියදම්**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දින සමාජ සේවා අංශය සඳහා ප්‍රින්ටරයක් මිලදීගැනීමට රු.82,142ක් වියදම්කර රු.57,930ක වියදම පමණක් වත්කම් අත්පත්කර ගැනීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා යන්ත්‍ර හා උපකරණ යටතේ ඇතුළත් පරිගණක උපකරණවල වටිනාකම රු.24,212ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	පරිපාලන වියදම් යටතේ මිලදී ගත් කොටසද සමඟ මුළු වටිනාකම 2025 පෙබරවාරි මාසයේදී ගිණුම්ගත කළ බව.	වත්කමේ නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය.

(ඇ) **දේපළ පිරියත හා උපකරණ**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් කාණ්ඩ 06 ක අවසන් ශේෂවල එකතුව රු.6,897,697,467ක්වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර මුද්‍රිත SA-82 වාර්තාවේ 2024 ජනවාරි 01 දිනට එම වත්කම් කාණ්ඩ 06ට අදාළව ආරම්භක ශේෂවල එකතුව රු.2,096,080,707ක් වුයෙන් එම ශේෂයන් අතර රු.4,801,616,760ක නොසැසඳීම් නිරීක්ෂණය වූ නමුත් මෙම නොසැසඳීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	ආරම්භක ශේෂය වෙනස් වීම පරිගණක පද්ධතියේ සිදු වන ක්‍රියාවලියක් වන අතර ඒ පිළිබඳ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ගොස් මෙම වසර තුළදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	නොසැසඳීම්වලට හේතු වූ කරුණු පරීක්ෂාකර එම නොසැසඳීම් නිවැරදි කර මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි ශේෂය තහවුරු කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේදී ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදීගැනීම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර ඇති භාණ්ඩාගාර මුද්‍රිත SA-82 වාර්තාව අනුව පිළිවෙලින් රු.18,827,797ක් සහ රු.11,521,736ක් වුවත් මුදල් පොත ඒසීඒ-2(ii) අනුව එම ශේෂ රු.17,946,182ක් සහ රු.13,852,972ක් වුයෙන් පිළිවෙලින් රු.881,615ක සහ රු.2,331,236ක නොසැසඳීම් විය.	ඉදිරියේදී එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	-එම-

(iii)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව, 2024 වර්ෂයේදී තක්සේරු කර තිබූ වාහන 36ක තක්සේරු වටිනාකම හා එම වාහනවලට අදාළව ගිණුම්ගත කර තිබූ වටිනාකම් අතර රු.108,560,000ක නොසැසඳීම් නිරීක්ෂණය විය.	මෙම වාහනවල වටිනාකම් ගිණුම්ගත කිරීමට අදාළ තොරතුරු ලැබී නොමැති බැවින් වත්කම් ගිණුම්ගත කිරීම යාවත්කාලීන කර නොමැති අතර අදාළ තොරතුරු ලද පසු අදාළ නිවැරදි කිරීමේ කටයුතු සිදු කරන බව.	නොසැසඳීම්වලට හේතු වූ කරුණු පරීක්ෂාකර එම නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(iv)	ඩබල් කැබ් රථ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය Passenger Vehicle යටතේ Jeep කාණ්ඩය යටතේ ද දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල Cargo Vehicle කාණ්ඩය යටතේද ඉදිරිපත් කර තිබුණු අතර ට්‍රැක්ටර් රථ හා බවුසර් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය Agriculture වාහන යටතේ ද දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Cargo Vehicle යටතේ ද දක්වා තිබුණි. තවද දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සේවා පියස් 02ක් පිහිටි ඉඩම්වල වටිනාකම ගොඩනැගිලි යටතේ ද දක්වා තිබුණු හෙයින් මූල්‍ය නොවන වත්කම් වාර්තාවන්හි වත්කම් වාර්තා කිරීමේදී නිවැරදි වර්ගීකරණය අනුව සිදුකර නොතිබුණු අවස්ථා විය.	2018 වර්ෂයට පෙර සිට වත්කම් ගිණුම් ගත කිරීමේදී සිදු කරන ලද ක්‍රමවේදයට අනුව වත්කම් ගිණුම්ගත කර ඇති අතර මේ පිළිබඳ නැවත සොයා බලා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පොදුවේ උපදෙස් නිකුත් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව සහ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2022 වර්ෂයේ ලද තොරතුරු අනුව සේවා පියස් 02 ක් ගිණුම් ගත කර ඇති බව.	මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී නිවැරදි වර්ගීකරණය අනුව සිදුකළ යුතු අතර අදාළ නිවැරදි කිරීම් සිදු කළ යුතුය.
(v)	බස් රථයක් හා ඩබල් කැබ් 3ක අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වුවත් එම වාහන වෙනත් ආයතන මඟින් භාවිතා කර තිබුණු අතර, ඉන් ඩබල් කැබ් රථයක් හැර අනෙකුත් වාහන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි.	මෙම වාහනවල තොරතුරු මේ වන විට තහවුරු කර ගෙන ඇති අතර එම වාහන වර්තමානයේ භාවිතා කරන ආයතන වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	සියලුම වාහන දිස්ත්‍රික් ලේකම් වෙත ගෙන්වා ගැනීම හෝ විධිමත් පරිදි අදාළ ආයතනවලට පැවරීමට කටයුතු කළ යුතුය.
(vi)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයිතිය සතු හා භාවිතා කරනු ලබන වටිනාකම රු.20,000,000ක් වූ ඩබල් කැබ් රථයක වටිනාකම මූල්‍ය නොවන වත්කම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණෙන් වාහනවල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දැක්වුණි.	KW-7180 අංක දරන වාහනය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ සැළසුම් අංශය භාරයේ පැවති අතර, ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියළුම වාහනවල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(vii)	ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් මීගමුව, කටාන හා වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කරනු ලබන වාහන 3ක වටිනාකම්වල එකතුව	වාහනවල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතා කරන, අයිතිය වෙනත් ආයතන සතු වාහන විධිමත් පරිදි

	වූ රු.14,700,000ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගිණුම් තුළ ඇතුළත්ව පැවතුණද එම වාහන පවරාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි.		පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(viii)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10කට අදාළව ඉඩම් කොටස් 138ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08කට අදාළ ගොඩනැගිලි 55ක් තක්සේරුකර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.	තවදුරටත් තක්සේරු කිරීමට පවතින ඉඩම් හා ගොඩනැගිලි ඉදිරියේ දී තක්සේරු කර ගිණුම්ගත කරන බව.	දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සියළුම ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් ගිණුම්ගත කළ යුතුය.
(ix)	2024 මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව 2024 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ ශේෂය රු.4,839,864,746ක් වූ අතර ගිණුම් අංශයෙන් ලද වියදම් වාර්තාවන්ට අනුව එම ශේෂය රු.4,772,812,452ක් විය. ඒ අනුව රු.67,052,294ක නොසැසඳුණු වෙනසක් පැවතුණි.	මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ ශේෂය රු.4,839,864,747ක් වන අතර එය නිවැරදි වේ. නමුත්, ගිණුම් අංශයෙන් ලද වියදම් වාර්තාවට ඇතුළත් වන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය පරිපාලන සංකීර්ණය ඉදිකරනු ලැබූ කොන්ත්‍රාත් ආයතනයට කරන ලද ගෙවීම් මුදල පමණකි.	නොසැසඳීම් පරීක්ෂා කර අදාළ නිවැරදි කිරීම් කළ යුතුය.
(x)	දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අයත් මූල්‍ය නොවන වත්කම් වාර්තාවන්හි සටහන් කර ඇති එක් එක් වත්කම්වලට අදාළ වටිනාකම් ජර්නල් සටහන් මගින් පසුගිය වර්ෂවලදී ගිණුම් ගතකර තිබූ නමුත් එම ජර්නල් සටහන්වලට අදාළව තහවුරු ලිපි ලේඛන ගොනුවක් කාර්යාල විසින් පවත්වාගෙන නොමැති වීමෙන් එම වත්කම් වටිනාකම්වල නිවැරදිතාව විගණනයේදී තහවුරු කර ගැනීම අපහසු කාර්යයක් විය.	විගණන නිරීක්ෂණය නිවැරදිය. මේ සම්බන්ධව ලිපිගොනුවක් පවත්වා ගෙන යාමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව.	ජර්නල් සටහන්වලට අදාළව තහවුරු ලිපිලේඛන ගොනුවක් පවත්වාගෙන යායුතු අතර ඒවා විගණනයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2024 නොවැම්බර් 04 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06/2020 ප්‍රකාරව 2025 ජනවාරි 03 දින හෝ එදිනට පෙර 2024 වර්ෂය සඳහා අක්මුදල් පියවීම	2024 දෙසැම්බර් 31 දිනට අක්මුදල් ගිණුමේ රු.3,000,000ක ඉතිරිවීමක් පවතින බව නිරීක්ෂණය වුයේ	මාර්ගෝපදේශය ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර මුදල් පොතේ ශේෂය මහා

	සඳහා වර්ෂය අවසානයේ මුදල් පොතේ ශේෂය මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම සඳහා අදාළ මුදල නිල බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවට භාරදී හර නිවේදනය ලබාගත යුතු වේ. නමුත් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේ අක්මුදල් පියවීම සිදුකිරීම සඳහා අදාළ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇත්තේ දින 18ක ප්‍රමාදයක් සහිතව 2025 ජනවාරි 21 දින විය.	ගිණුම් පියවීමේ දිනෙන් පසුව බැවින් එසැනින්ම භාණ්ඩාගාරයට මුදල් ප්‍රේෂණය කළ බව.	භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය.

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව වැඩිහිටි ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන ලෙජරය 2024 වර්ෂයේ මාර්තු දක්වා පමණක් යාවත්කාලීන කර තිබුණු අතර විගණිත දිනය වූ 2024 නොවැම්බර් 20 දක්වා මාස 07 ක් එම ලෙජරය යාවත්කාලීන නොවීම හේතුවෙන් එම මාසයන් තුළ අඛණ්ඩව මාස තුනකට වඩා වැඩි වාර ගණනක් දීමනා ලබානොගත් දීමනාලාභීන් ගණන ලෙජරය හරහා හඳුනාගැනීම සිදුකර නොතිබුණි.	වැඩිහිටි දීමනා විෂයභාර නිලධාරියා වෙනත් අංශයකට මාරු කිරීම හේතුවෙන් ලේඛනය අඛණ්ඩව යාවත්කාලීන කිරීමට අපහසු විය.	ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු අතර එසේ කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.
(ii)	2023 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 හි 05 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සාමාජික ණය ලේඛන (සී.සී 10) අකෘතියට අනුව නිසි පරිදි ශේෂකර පවත්වා ගෙන නොතිබුණි.	සාමාජික ණය ලේඛනය යාවත්කාලීන කර නිවැරදිව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ හා මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බව සහ මේවන විට නිවැරදිව පවත්වාගෙන යන බව.	සාමාජික ණය ලේඛනය නිසි පරිදි ශේෂකර, යාවත්කාලීන කර පවත්වා ගත යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 1645 (අ) හි විධිවිධාන අනුව වාහනය වෙනුවෙන් 267 පොදු ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	අඩුපාඩු නිවැරදි කරන ලෙස දන්වන ලදී.	සෑම වාහනයක් සම්බන්ධයෙන්ම තොරතුරු සම්පූර්ණකර මුදල් රෙගුලාසිය ප්‍රකාරව වාහන ලොග් පොතක් පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ 1.6.1 (ඇ)(1) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1 (ඇ) (viii) ඡේදයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයන් 09 ක් හා එක් මූලධන වැය විෂයක එකතුව රු.95,087,150ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කර තිබුණු අතර එය සියයට 01 සිට සියයට 73 දක්වා වූ පරාසයක වූයෙන් විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	අපේක්ෂිත පරිදි වැටුප් වැඩි නොවීම සහ අතිකාල, නඩත්තු වියදම්, තැපැල් වියදම් අඩුවීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අපේක්ෂිත පරිදි බිල්පත් ඉදිරිපත් නොවීම.	හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පුනරාවර්තන වැය විෂයන් 17ක් සහ මූලධන වැය විෂයන් 02ක් සඳහා ලබාදී තිබුණු එකතුව රු.110,600,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.74,067,574ක් පමණක් උපයෝජනය කර තිබුණු හෙයින් ඉතිරිවීම් රු.36,532,426ක් වූ අතර ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 99 දක්වා වූ පරාසයක පැවතුණි.	වර්ෂය තුළ මැතිවරණ දෙකක් පැවතීම නිසා ගමන් වියදම්, ඉන්ධන වියදම් අඩුවීම, ලිපි ද්‍රව්‍ය අරපිරිමැස්මෙන් භාවිත කිරීම, ඇතැම් වියදම් අවම වීම, නඩත්තු කටයුතු සීමා වීම, පරිශ්‍රයේ ඇති අනිකුත් ආයතන අතර මාසික බිල්පත් ගාස්තු බෙදීයාම, රක්ෂණ වාරික ගාස්තු අඩුවීම, වියදම් කළමනාකරණය කිරීම, නිලධාරීන් දේපළ ණය ඉල්ලුම් කිරීම අඩුවීම වැනි හේතු දක්වා තිබුණි.	-එම-.
(ඇ)	වැය විෂය අංක 03 කට අදාළව මු.රෙ 66 මාරු කිරීම් සිදු කළ පසුවද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් සියයට 17කට වඩා වැඩි ප්‍රතිශතයක ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.	ලිපි ගණුදෙනු අවම වීම හේතුවෙන් තැපැල් වියදම් අඩුවීම, අපේක්ෂිත පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් බිල්පත් නොලැබීම, ඉන්ධන වියදම් අවම වීම හේතුවූ බව.	-එම-

(ඇ)	ගම්පහ දිස්ත්‍රික් ලේකම් නව කාර්යාල සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 590.8ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු අතර ඉන් රුපියල් මිලියන 355.5ක් පමණක් වියදම් කර තිබුණි. මේ අනුව රුපියල් මිලියන 235.2ක් එනම් සියයට 39.8ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.	ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාළ බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් සියළු ප්‍රතිපාදන උපයෝජනය වී නොමැති බව.	නිශ්චිත කාර්යයක් සඳහා වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතු බව.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මියගිය බව දැනුම් දීමට ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතූන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුළ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මගින් 2024 දෙසැම්බර් 31 දිනට රු.36,115,771 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09කට අදාළ විගණනයට ඉල්ලූ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවීම් සිදු කළ පාර්ශව වෙත පියවර ගැනීමත්, වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව තම කොට්ඨාශයේ යම් විශ්‍රාමිකයෙකු මියගිය පසු දින 07ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දීම ග්‍රාම නිලධාරියකු විසින් සිදු කළ යුතු අතර 2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගෙන් බී 73 දරන වාර්තාවට අදාළ තොරතුරු ලබාගෙන තම කාර්යාලයට අදාළ විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ ලේඛනය යාවත්කාලීන කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් නොපමාව ක්‍රියාකළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් විශ්‍රාමිකයා මියගිය පසුවත් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සිදුවන අතර එම මුදල් නැවත අයකර ගැනීම අපහසු කාර්යයක් වී තිබුණි. ඒ අනුව මියගිය බව දැනුම් දීමට ප්‍රමාද වීම හේතුවෙන් වැඩිපුර සිදුකරන ලද	වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් අයකර ගනිමින් පවතින බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව වාර්තා කර ලේඛන යාවත්කාලීන නොකළ වගකිව යුතු නිලධාරීන්ට පියවර ගැනීමටත්, වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

ගෙවීම්වලින් ගම්පහ, මීගමුව, අත්තනගල්ල, බියගම සහ දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පිළිවෙලින් විශ්‍රාමිකයින් 68ක්, 09ක් 01ක්, 05 ක් සහ 04 දෙනෙකු වෙනුවෙන් පිළිවෙලින් රු.6,117,119ක්, රු.775,891ක්, රු.249,891ක්, රු.571,145ක් සහ රු.597,091ක් 2024 දෙසැම්බර් 31 දිනවන විට ආපසු අයකරගත යුතුව තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මූල්‍ය පාලන හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කිරීම හා සහතික වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ			
	XXIV පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4.3, 4.4, 4:5, 4:6 හා 6:3 වගන්ති	විශ්‍රාම ගොස් සිටින නිලධාරින් 05 දෙනෙකුගේ එකතුව රු.704,357ක් වූ ණය ශේෂ හා මියගිය	විශ්‍රාම පාරිතෝෂිතයෙන් හා මරණ පාරිතෝෂිතයෙන් අයකිරීමට කටයුතු	ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය.

		නිලධාරීන් සිව් දෙනෙකුගෙන් අයවිය යුතු රු.746,325ක් වූ ණය ශේෂ 2025 මාර්තු මාසය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.	කරමින් පවතින බව සහ මාසික විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අයකරන බව.	
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 07ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.	මැතිවරණ කටයුතු හේතුවෙන් සංචිත වාහන ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීම ප්‍රමාද වූ බව.	චක්‍රලේක ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 10 වන වගන්තිය	චක්‍රලේඛය ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 151න් කාර්යාල 52 ක් පමණක් පරීක්ෂා කර තිබූ අතර ඉන් කාර්යාල 51 ක් පරිපාලන ග්‍රාම නිලධාරී විසින් පරීක්ෂා කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් විසින් කිසිදු ග්‍රාම නිලධාරි කාර්යාලයක් පරීක්ෂා කර නොතිබුණි.	මේ වන විට පරිපාලන ග්‍රාම නිලධාරි විසින් කාර්යාල 76ක් සහ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් එක් කාර්යාලයක්ද පරීක්ෂා කර ඇති බව සහ ඉදිරියේදී ඉතිරි කාර්යාලද පරීක්ෂා කිරීමට බලාපොරොත්තු වන බව	අවම වශයෙන් මාස 04 කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරි කාර්යාලයක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන් කරගෙන පරීක්ෂාවට ලක් කළ යුතුය.
(ඈ)	2019 අප්‍රේල් 04 දිනැති අංක 10/2019 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය චක්‍රලේඛ	ග්‍රාම නිලධාරීන්ට අදාළව පොදු කොට්ඨාශ දින රැස්වීම් මසකට වරක් පැවැත්වීම අනිවාර්යය වුවද 2023 හා 2024 වර්ෂවලදී ගම්පහ දිස්ත්‍රික් බල ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් එපරිදි රැස්වීම් පවත්වා නොතිබුණි.	ජන හා නිවාස සංගණනයට අදාළ අවසන් අදියරේ කටයුතු, මැතිවරණ කටයුතු, අඩු ආදායම් ලාභීන්ට සහල් බෙදාදීමේ කටයුතු, අයහපත් කාළගුණ තත්වය යනාදී විවිධ හේතුන් නිසා 2024 වර්ෂයේදී රැස්වීම් පැවැත්විය නොහැකි වූ බව.	ග්‍රාම නිලධාරීන්ට අදාළව පොදු කොට්ඨාශ දින රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතුය.
(ඉ)	2021 පෙබරවාරි 12 දිනැති අංක 02/2021 දරන රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ	මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 හා 2024 වර්ෂවලදී පිළිවෙලින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් 07ක් සහ 04ක් පමණක් පවත්වා තිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදිය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් ලබාදෙන දින අනුව කමිටුව පවත්වන බවත් 2024 මැතිවරණය හේතුවෙන් රැස්වීම් වාර ගණන අඩුවී ඇති බව.	මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වමට කටයුතු කළ යුතුය.

(ඊ)	2021 ජනවාරි 02 දිනැති අංක 01/2021 දරන පරිසර චක්‍රලේඛ	දිස්ත්‍රික් පරිසර කමිටුව මාස 02කට වරක් රැස්විය යුතු වුවද 2023 වර්ෂයේදී දිස්ත්‍රික් පරිසර කමිටුව එක් අවස්ථාවකදී පමණක් රැස්වීම පවත්වා තිබුණු අතර 2024 වර්ෂයේදී කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි.	දිස්ත්‍රික් පරිසර කමිටුවේ කැඳවුම්කරු ලෙස අදාළ අමාත්‍යාංශයේ නිලධාරියෙක් පත්කර ඇති බවත් කමිටු කැඳවීම එම නිලධාරියා විසින් සිදුකළ යුතු බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් පරිසර කමිටුව, මාස 02 කට වරක් පැවැත්විය යුතුය.
(උ)	2021 පෙබරවාරි 22 දිනැති අංක NFS/2021/01 දරන කෘෂිකර්ම අමාත්‍යාංශ චක්‍රලේඛ	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්විය යුතු වුවද 2023 සහ 2024 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් කමිටු 05 ක් සහ 03 ක් පමණක් පවත්වා තිබුණි.	දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී සහ කන්න රැස්වීම්වලදී පොහොර වැඩසටහන පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරන බැවින් මෙම කමිටු රැස්වීම පැවැත්වීමට අවශ්‍ය නොවුනු බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්විය යුතුය.

3.5 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පතු ගිණුම් 04කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.137,751,747ක කල් ඉකුත් වූ ශේෂ පැවතිය ද මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව රජයේ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	වසර 02ක ඉක්ම වූ පොදු තැන්පත් ගිණුම් 03කට අදාල ශේෂයන්ගෙන් මේ වන විට රු.35,409,918ක් නිරවුල් කර ඇති බව සහ නඩු තීන්දුව ලැබෙන තෙක් නිරවුල් කළ නොහැකි රු.4,418,000ක් පවතින බව සහ ඉතිරි ශේෂයන් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. තවද නඩු කටයුතු පැවතීම ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු අවසන් නොවීම වැනි හේතු නිසා ඉඩම් තැන්පතු නිරවුල් කළ නොහැකි බව.	විධිමත් පරිදි කටයුතු කර මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වලින් රු.2,125,374ක ශේෂයට අදාළ චෙක්පත් 11ක් 2025 පෙබරවාරි 18 දිනය වන විටත් අදාළ පාර්ශවයන් වෙත නිකුත් නොකර ගිණුම් අංශය සතුව පැවතුණි. ඒ තුළ භාණ්ඩ නොලැබීම මත ආදායකයන් වෙත භාර නොදුන් වටිනාකම රු.284,473කට අදාළ චෙක්පත් 5ක්, බිල්පත් නොලැබීම මත ආදායකයන් වෙත භාර නොදුන් වටිනාකම රු.123,972කට අදාළ චෙක්පත් 2ක්, භාණ්ඩ අවසන් උපයෝජනයට සුදුසු පරිදි සකසන තෙක් ආදායකයන් වෙත භාර නොදුන් රු.1,367,775ක් වූ චෙක්පතක්, දැනුම් දී ඇති නමුත් චෙක්පත් ලබා ගැනීමට ඉදිරිපත් නොවූ රු.349,154ක් වටිනා චෙක්පත් 3ක් විය.	අදාළ භාණ්ඩ හා බිල්පත් ලැබී ඇති බැවින් හා භාණ්ඩ අවසන් උපයෝජනයට සුදුසු පරිදි සකසා භාර දී ඇති බැවින් අදාල චෙක්පත් 11 ආදායකයින් වෙත භාර දී ඇති බව.	භාණ්ඩ හා සේවා සපයා ගැනීමෙන් තොරව මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවී ගෙවීම් අනුමත කළ නිර්දේශ කළ හා සහතික කළ නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවර ගත යුතුය

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 03 ඡේදය අනුව සෑම මුදල් වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර, ඒ සඳහා අදාළ ආකෘති මාර්ගෝපදේශ අංක 12 යටතේ හඳුන්වාදී තිබුණි. ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය සඳහා13ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද, උක්ත චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු අදාළ වර්ෂයට යාවත්කාලීන කළ	විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඔබ විසින් දක්වා ඇති කරුණු වෙන වෙනම සකස් කර තිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ලෙස එකට එකතු කර පෙන්වා දී නොමැත. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් අතර 2025 වර්ෂය සඳහා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ බව.	චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ පරිදි කටයුතු නොකළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය.

ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අදාළ වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් **/** ප්‍රතිඵල (Output / Outcome), වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඒ තුළ ඇතුළත්ව නොතිබුණි.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේදී වැඩසටහන් 06ක් යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති 173න්, වටිනාකම රු.27,725,079ක් වූ ව්‍යාපෘති 52ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වූ ඉටුනොකළ ව්‍යාපෘති 32න් ව්‍යාපෘති 27ක් නියමිත කාලසීමාව තුළ භාණ්ඩ ගෙන්වා ගැනීමට නොහැකිවීම නිසාද, ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ වූ ව්‍යාපෘතිය වෙනත් කොට්ඨාශයකට මාරු කිරීම හේතුවෙන් සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති 19ක් ප්‍රජාපාදක සංවිධාන ඉදිරිපත් නොවීම හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.	අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විධිමත් පරිදි කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, අනුමත ව්‍යාපෘති සියල්ලම ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ මීරිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වැබොඩමුල්ල මැටි නිෂ්පාදන ගම්මානය ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 36 දෙනෙකු වෙනුවෙන් අමුද්‍රව්‍ය උපකරණ ආදිය මිලදී ගැනීම්	ඉතා ඉහළ විදුලි ඒකක සංඛ්‍යාවක් වැයවන බැවින් ප්‍රතිලාභීන් විසින් මෙම උඳුන් භාවිතයට නොගන්නා බව හා සූර්ය කෝෂ පැනල පද්ධතියක් ලබාගැනීමට ඉල්ලීම් කර ඇති බව	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට විධිමත් අධීක්ෂණයක් හා මඟ පෙන්වීමක් අදාළ නිලධාරීන් විසින් කළ යුතුය.

	හා පුහුණු වැඩසටහන් යන ක්‍රියාකාරකම් සඳහා රු.8,607,956ක් වැය කර තිබුණු අතර, ඉන් විසිතුරු භාණ්ඩ පිළිස්සීම සඳහා රු.2,592,000ක වටිනාකමකට විදුලි උදුන් 2ක් මිලදී ගෙන තිබුණද, මෙම විදුලි උදුන් ක්‍රියාකරවීම සඳහා විශාල විදුලි ඒකක සංඛාවක් වැය වීම හේතුවෙන් එම උදුන් භාවිතයට ගෙන නොතිබුණි.		
(ආ)	2021 වර්ෂයේ සෞභාගයා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ මීරිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නාල්ල මැටි ගඩොල් නිෂ්පාදන ගම්මානය ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 31 දෙනෙකු වෙනුවෙන් අමුද්‍රව්‍ය, උපකරණ ආදිය මිලදී ගැනීම් සහ පුහුණු වැඩසටහන් යන ක්‍රියාකාරකම් සඳහා රු.6,808,050ක් අනුමත වී තිබුණු අතර එහි සත්‍ය වියදම රු.6,072,642ක් විය. නමුත් මෙම ප්‍රතිලාභීන් 31 දෙනාගෙන් මේ වන විට කර්මාන්තයේ යෙදී සිටින්නේ 17 දෙනෙකු පමණක් වූ අතර විවිධ හේතූන් නිසා ප්‍රතිලාභීන් 14 දෙනෙකු කර්මාන්තයෙන් බැහැර වී ඇති අතර ඔවුන්ට වැඩ මඩු හා ගඩොල් ආවරණ මඩු සකස් කිරීමට ලබාදුන් රු.1,949,320 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	මැටි ගඩොල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා මෙන්ම අමුද්‍රව්‍ය වල පවත්නා අධික මිළ ගණන්, ගඩොල් පිලිස්සීම සඳහා යොදාගනු ලබන දර සඳහා වැඩි මිලක් ගෙවීමට සිදුවීම, ආර්ථික අර්බුධය හමුවේ ඉදිකිරීම් කටයුතු අඩාලවීම වැනි හේතු මත නිෂ්පාදකයින් කර්මාන්තයෙන් ඉවත්වීම සිදුව ඇති බව.	-එම-
(ඇ)	ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය තුළදී කැනපි හට් 13ක් හා ඉතිරි ව්‍යාපෘති මුදලින් ප්ලාස්ටික් පුටු මිලදී ගැනීම සඳහා රු.3,567,595ක මුදලක් අනුමත කර තිබුණි. නමුත් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කැනපි හට් 13ක් මිල දී ගෙන තිබූ අතර ප්ලාස්ටික් පුටු 1168ක් මිලදී ගැනීම සඳහා අනුමත කරන ලද රු.1,918,504ක මුදල උපයෝජනය කර නොතිබුණි. මේ අනුව මෙම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු හා කාර්යසාධනය ලගා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත	-එම-

(ඇ)	2025 ජූලි 01 දින ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩා පරිශ්‍රය භෞතික පරීක්ෂාවේදී 2024 වර්ෂයේ ව්‍යාපෘති 03ක් වෙනුවෙන් මිලදී ගෙන තිබූ වටිනාකම රු.320,650 ක් වූ භාණ්ඩ අයිතම වර්ග 11කට අදාළ භාණ්ඩ, අදාළ ප්‍රතිලාභීන් වෙත නිකුත් නොකර ගබඩාව තුළ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු හා කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.	පිළිතුර ඉදිරිපත් කර නොමැත	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය

4.4 **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ අඩක් නිම කළ "නිල සෙවණ" ගොඩනැගිලි 07 ක් තිබූ අතර මෙම ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කර තිබුණේ 2018 වර්ෂයේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒවා නිම කර නොතිබුණි. ඇස්තමේන්තු මුදල රු. මිලියන 14ක් වූ මෙම ඉදිකිරීම් වෙනුවෙන් මෙතෙක් දරා තිබූ වියදම රුපියල් මිලියන 1.4ක් සහ භෞතික ප්‍රගතිය සියයට 2ක් විය.	මෙම ගොඩනැගිලිවල පදනම පමණක් නිම් තත්ත්වයේ පවතිණ බවද, ඉතිරි වැඩ නිමකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇතත් ප්‍රතිපාදන ලැබී නොමැති බව.	මෙම ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් තවදුරටත් ප්‍රතිපාදන වෙන්කර ගැනීම ආර්ථික වශයෙන් ඵලදායීද යන්න සලකා බලා ඉදිරි පියවර ගත යුතුය
(ආ)	දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව 2022 වර්ෂයේ "ගම සමග පිළිසඳරක්" වැඩසටහන යටතේ ආරම්භ කර රු.7,352,909ක වියදමක් දරන ලද ව්‍යාපෘති 17 ක් අතරමග නතරකර තිබුණි. ඉන් ව්‍යාපෘති 13 ක භෞතික ප්‍රගතිය සියයට 45 ට වඩා අඩු මට්ටමේ පැවතුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව අඩු ප්‍රගතියක් වාර්තා කර ඇති ව්‍යාපෘති, අතරමඟ නතර කර ඇති බව සහ මෙම ව්‍යාපෘතිවලින් 02ක් මේ වනවිට අවසන් කර ඇති බව.	ව්‍යාපෘති කාලීනව නිම කිරීම සඳහා පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමත්, විධිමත් අධ්‍යනයක් කර අතරමඟ නතරකරන ලද ව්‍යාපෘති අවසන් කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	2022 වර්ෂයේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ, 62 බටහිර කොන්ගොඩමුල්ල ග්‍රාමයේ ප්‍රජා ශාලාවට අළුතින් කොටසක් එක් කර බහු කාර්ය ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත රු.1,200,000ක් වූ ප්‍රතිපාදනයෙන් රු.401,229ක් පමණක් වැය කර තිබුණි. ප්‍රතිපාදන මුදල්	2024 වර්ෂයේදී රු.500,000ක මුදලක් අනුමත වී තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව.	අතරමඟ නවතාදමා ඇති ව්‍යාපෘති පිළිබඳ අධ්‍යනය කර එම ව්‍යාපෘති ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදා ගත හැකි තත්වයට නිම කිරීමට කටයුතු කළ යුතුය.

	ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ දී විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.500,000ක් අනුමත වී තිබුණ ද ග්‍රාමීය කමිටුවේ ඉල්ලීම අනුව ඇස්තමේන්තුව නැවත සකස්කරන්නට සිදුවීම හා ව්‍යාපෘතිය සිදුකිරීමට කාලය නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී වසර දෙකකට වඩා වැඩි කාලයක් ගතව තිබුණු මෙම ගොඩනැගිල්ල ඇතුළත වල් බිහිවී, අව්වැසිවලට නිරාවරණය වී විනාශ වෙමින් පැවතුණි.		
(ඇ)	2022 වර්ෂයේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ 95 A, කළුවාරිප්පුව උතුර ප්‍රජාශාලාවට කොටසක් එකතු කර සේවා පියසක් ලෙස සංවර්ධනය කිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත රු.1,200,000ක් වූ ප්‍රතිපාදනයෙන් රු.298,958ක් පමණක් වැය කර තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදන මුදල් ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේ දී විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.500,000ක මුදලක් ලැබී තිබුණි. එයින් රු.475,301ක් වැයකර වහල මට්ටම දක්වා බිත්ති බැඳ ඇති නමුත් එය භාවිතයට ගත හැකි තත්වයට වැඩ අවසන්කර නොතිබුණි.	වැඩ සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකෙරුණ බැවින් ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා ඇති බව.	-එම-.

4.5 **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සූර්යය පැනල පද්ධති සැලසුම් කිරීම හා සපයා සවිකිරීම වෙනුවෙන් 2024 වර්ෂයේදී වෙන්කළ මුදල රුපියල් මිලියන 100 කි. 2024 අප්‍රේල් 05 දින සිදුකළ මිලගණන් කැඳවීමට අනුව නිෂ්පාදන ඒකකයක් අවම මිල ඉදිරිපත්	2024 වර්ෂයේ ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු මෙන්ම පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් කාර්යාල ගොඩනැගිල්ලේ සූර්යය පැනල පද්ධතිය සවිකිරීම ප්‍රමාද විය.	ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටත්, ව්‍යාපෘතිය කඩිනමින් නිමකර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය.

කළ ආයතනය වෙත රු.72,927,496ක (වැට් බදු රහිත) මුදලකට කොන්ත්‍රාත්තුව 2024 ජුනි 07 දින ප්‍රදානයකර තිබුණි. 2024 ජුනි 25 දින කොන්ත්‍රාත්කරු සමග එළඹි ගිවිසුම අනුව 2024 ජුනි 25 දින වැඩ ආරම්භ කරන ලද මෙම කොන්ත්‍රාත්තුව 2024 සැප්තැම්බර් 25 දින වැඩ අවසන් කළ යුතු වුවද, වැඩ අවසන් කිරීමේ කාලය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. එහෙත් එදින වන විටත් වැඩ අවසන්ව නොතිබුණු මෙම ව්‍යාපෘතියේ සූර්ය පැනල සැලසුම් කිරීම්, සපයා සවිකිරීම් කොටස් පමණක් 2025 පෙබරවාරි 28 දින අවසන් කළ බවට කොටසක් සම්පූර්ණ කිරීමේ සහතිකය උපදේශන ආයතනය විසින් නිකුත් කර තිබුණි. සූර්යය පැනල පද්ධති සවිකිරීම තුළින් අපේක්ෂිත අරමුණ වන්නේ විදුලිය වියදම අවමකර ගැනීම වුවද, ජාතික විදුලිබල මණ්ඩලය මඟින් විදුලි ජනනය වීම පරීක්ෂා කිරීමට 2025 මැයි 31 දක්වා කාලය ගතවන බව දන්වා තිබීම නිසා එම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් විදුලිය වියදම අවම කරගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව 2024 සැප්තැම්බර් මාසයේදී වැඩ අවසන් කිරීමට නියමිතව පැවති මෙම ව්‍යාපෘතිය 2025 මැයි මාසය වනවිටත් අවසන් වී නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය මාස 02ක් ප්‍රමාද වීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කාර ආයතනය වෙතින් ප්‍රමාද ගාස්තුද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අපේක්ෂිත පරිදි මාසික විදුලි වියදමෙහි අඩුවීමක් සිදු කරගැනීමට නොහැකිව තිබුණි.		

4.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	"ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන" යටතේ 2017 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල සීමාව තුල ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි ග්‍රාම නිලධාරී	තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැකි අක්‍රීය තත්වයේ පවතින සමිතිවල ලියාපදිංචිය අහෝසි කර ගැනීමටද, අක්‍රීය සමිති සතු රජයේ අරමුදල් සක්‍රීය සමිති සඳහා ලබාදීමටද, අක්‍රීය	විධිමත් පරීක්ෂණයක් කර අක්‍රීය සමිති සක්‍රීය කිරීමට කටයුතු කිරීම හෝ පනත සතු රජයේ අරමුදල්

	වසම් තුළ සමිති 152 ක් පිහිටුවා තිබූ අතර, ඒ සඳහා රු.92,537,140ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් සමිති 19 ක් පමණක් සක්‍රීය මට්ටමේ පැවති අතර ඉතිරි සමිති 133 ම අක්‍රීය මට්ටමේ පැවතුණි. මෙම අක්‍රියව පවතින ග්‍රාම ශක්ති සමිති සතුව මව් ගිණුම්වල රු.67,569,003ක් හා ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල රු.8,974,794ක් ලෙස එකතුව රු.76,543,797ක එකතු ශේෂයක් පැවතුණි. තවද අක්‍රීය මට්ටමේ පවතින සමිති ලියාපදිංචිය සඳහා දරන ලද වියදම් හා ඒ වෙනුවෙන් දැරූ අනෙකුත් වියදම්ද නිශ්කාර්ය වී තිබූ අතර මෙම වැඩසටහන යටතේ ලබා දුන් ණයවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3ක රු.2,122,759 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.	තත්වයේ පවතින සමිති, සමිති ව්‍යවස්ථාව අනුව සක්‍රීය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	විධිමත් පරිදි රාජ්‍ය ආදායමට ගැනීම හෝ කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේදී “සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන” යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලුත්ගම බෝගමුව කලාපයේ ආරම්භ කළ බිම්මල් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 25 දෙනෙකු තෝරාගෙන තිබුණි. එහෙත් ඉන් 12 දෙනෙකු පමණක් ව්‍යාපෘතියට සක්‍රීය දායකත්වය ලබාදී තිබූ අතර, ඉතිරි 13 දෙනා වෙනුවට වෙනත් ප්‍රතිලාභීන් 13 දෙනෙකු ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය රහිතව තෝරාගෙන තිබුණු අතර, ඔවුන් තෝරාගැනීමේ පදනම හෝ සලකාබලන ලද නිර්නායකයන් පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ප්‍රතිලාභීන් විසින් වසර 05ක කාලයක් සඳහා ප්‍රාදේශීය ලේකම් සමඟ ගිවිසුමකට එළඹ තිබුණ ද, නිවැරදිව ප්‍රතිලාභීන් තෝරා නොගැනීම නිසා ගිවිසුම්ගත වූ ප්‍රතිලාභීන් තිදෙනෙකු ලබාගත් මුදල් ආපසු ගෙවා ව්‍යාපෘතියෙන් ඉවත්වී තිබුණි. තවද බිම්මල් ගෘහ සැලැස්මක් ප්‍රතිලාභීන්ට ලබා නොදීම, ලබා දුන් වගා මළු ප්‍රමිතියෙන් තොර වීම යෝජිත ස්ථානවලින් බීජ ලබාගෙන නොතිබීම, පොලිතීන් සීලර් යන්ත්‍ර ප්‍රතිලාභීන් වෙත භාර දී නොතිබීම වැනි හේතු මත මෙම	පිළිතුරු ඉදිරිපත්කර නොමැත.	ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි.

	ව්‍යාපෘතිය තිරසාරව පවත්වා ගෙන යාමට නොහැකි වී තිබුණි.		
(ඇ)	2024 වර්ෂයේදී “සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය” යටතේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අමුණුගොඩ කලාපයේ රු.1,096,500ක් වැය කර ක්‍රියාත්මක කර තිබුණු ගම් කුකුළු බිත්තර නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 18 දෙනෙකු තෝරාගෙන තිබුණි. නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභීන් 08 දෙනෙකු පමණක් සක්‍රීය දායකත්වය ලබා දී තිබුණු අතර, ඉතිරි ප්‍රතිලාභීන් 11 දෙනා වෙනුවට වෙනත් ප්‍රතිලාභීන් 11 දෙනෙකු ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය රහිතව තෝරාගෙන තිබුණු අතර එම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පදනම හෝ තෝරා ගැනීමේ දී සලකා බලන ලද කරුණු හෝ මුලින් තෝරාගත් ප්‍රතිලාභීන් ඉවත් වීමට හේතුව යන කරුණු සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද, අදාළ බලධාරීන්ගේ සහතික වීමකින් තොරව ප්‍රතිලාභීන් 6ක් වෙත රු 105,000 ක අවසන් වාරික ගෙවීම, ප්‍රමාණවත් ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති ප්‍රතිලාභීන් තෝරා ගැනීම, මිලදී ගත් කිකිළි පැටවුන්ගෙන් පැටවුන් සියයට 27-52 අතර ප්‍රමාණයක් බෙදා දී කෙටි කාලයකින් මිය යාම, සම්මත ප්‍රමාණයට වඩා වැඩිපුර පිරිමි සතුන් ලබා දීම හා අපේක්ෂිත පරිදි බිත්තර අස්වැන්නක් නොලැබීම යන හේතු මත ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත්කර නොමැත.	ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත් විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු කර ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමටත් පියවර ගත යුතුය.

4.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4)(අ) පරිදි සෑම මුදල් වර්ෂයක් අවසන් වීමෙන් දින එකසිය අසූවකට නොඅඩු කාලයකදී අදාළ ලිඛිත නීතීන් සහ ඒ යටතේ සාදන ලද නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා අනෙකුත්	විගණන නිරීක්ෂණ පිළිගනිමි. වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් කෙරෙන කාර්යයන්ද ඇතුළත් කර සකස් කරන ලෙස අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබා දෙන ලදී.	අදාළ පනත අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම ආවරණය වන පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කළ යුතුය.

	ලියවිලි අතර ගිණුම් සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ ඇතුළත් වාර්ෂික කාර්යසාධන වාර්තාවක් එම පනතේ 3(2)(අ)(i) අනුව අයවැය අස්ථිත්වයන් විසින්ම සකස් කළ යුතු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ තොරතුරු පමණක් ඉදිරිපත් කර තිබුණු අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13හි තොරතුරු ඇතුළත් කර නොතිබුණි.		
(ආ)	වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ආකෘතිය 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 ඡේදය පරිදි මාර්ගෝපදේශ අංක 14ට අනුකූල නොවන ලෙස සමස්ථ මූල්‍ය කාර්යසාධනය, පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර සහ අනුකූලතා වාර්තාව ඉදිරිපත් කර තිබුණි.	ඉදිරි වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකස් කිරීමේදී මාර්ගෝපදේශ උපදෙස්වලට අනුකූලව සකස් කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	චක්‍රලේඛ සහ අදාළ මාර්ගෝපදේශ උපදෙස් අනුව කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුය.

4.8 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා දහම්පාසල් උපකරණ මිලදී ගැනීමේදී ප්ලාස්ටික් පුටුවක් සඳහා එකක් රු 1,601 ක අවම මිල ඉදිරිපත් කළ ආයතන අනෙකුත් සියළුම පිරිවිතර සපුරා තිබියදී ප්‍රමාණාත්මක හේතු දැක්වීමකින් තොරව අවම දෙවන මිල රු.1,649 ක පුටු ලබා ගැනීමට තාක්ෂණ කමිටු නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.	තාක්ෂණික ඇගයීම් කමිටු වෙතින් පැහැදිලි කිරීමක් ලබාගත හැකි බවත්, සාම්පල් පරීක්ෂාවේදී දෙවන ආයතනයෙන් ඇදි රහිත ප්ලාස්ටික් පුටු ගුණත්වයෙන් ඉහළ බවට නිරීක්ෂණය වූ බවත් මුද්‍රණ දෝෂයන් හේතුවෙන් පළමු ආයතනය ගුණාත්මක භාවයෙන් වැඩි ලෙස සටහන්ව ඇති බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී රජයට සිදු වී ඇති පාඩුව අය කර ගැනීමටත්, අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 12ක් වෙනුවෙන් වටිනාකම රු.2,022,750ක් වූ කැනපි හට් 18ක් මිලදී ගෙන තිබුණි. 2024 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන් ලේඛනය අනුව කැනපි හට් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති වූ අතර මිල ගණන් කැඳවීමට	පිළිතුර ඉදිරිපත් කර නොමැත.	අවධිමත් පරිදි කටයුතු කළ නිලධාරීන්ට පියවර ගත යුතු අතර සැපයුම්කරුවන් තෝරා ගැනීම විධිමත් පරිදි සිදු කළ යුතුය.

සැපයුම්කරුවන් තෝරාගත් ආකාරය හා සැපයුම්කරුවන් වෙත මිල කැඳවීම් ලිපි යොමු කළ ආකාරය පිළිබඳ ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එමෙන්ම මෙම ප්‍රසම්පාදනයේදී ප්ලාස්ටික් පුටු, කැනපි හට්, තහඩු හට්, පුස්තකාල කබඩ්, උදලු තල හා වයිට් බෝඩ් යන සමජාතීය නොවන භාණ්ඩ සඳහා පොදුවේ එක් මිල ගණන් කැඳවීමක් පමණක් සිදු කර තිබුණෙන්, සමජාතීය භාණ්ඩ සැපයුම්කරුවන් වැඩි පිරිසකින් මිල ගණන් ලබා ගැනීමට නොහැකිවීම මත ප්‍රසම්පාදනයේදී අවම මිලකට ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමේ අවස්ථාව අවම වී තිබුණි.

4.9 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05කට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන වන විට උපයෝජනය නොකරන නිල නිවාස 09ක් පැවතුණි. මෙයින් අත්තනගල්ල හා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව පිළිවෙලින් නිල නිවාස 02ක් හා එක් නිල නිවසක් භාවිතා කළ නොහැකි මට්ටමක පැවති අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව එක් නිල නිවසක් හා බියගම, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අදාළව පිළිවෙලින් නිල නිවාස 02ක් හා 03ක් අළුත්වැඩියා කළයුතු මට්ටමේ පැවතියද අළුත්වැඩියා කර ඵලදායී කාර්යයකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ නිල නිවාස 02 භාවිතයට ගතනොහැකි තත්ත්වයේ පවතින බැවින් කඩා ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම මත ගබඩා භාණ්ඩ තැබීම සඳහා භාවිතා කරන බව. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ නිල නිවාසය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර මෙම වසරේ එය ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරි වර්ෂයේ දී ඇස්තමේන්තුවලට ඇතුළත් කරන බව හා බියගම, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ නිල නිවාස 05 අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර අළුත්වැඩියා කළහැකි තත්වයේ පවතින නිල නිවාස අළුත්වැඩියා කර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බියගම උතුර සේවා පියස පිහිටි කොළඹහේන වත්ත ඉඩමේ පර්චස් 06ක ඉඩම සහ එම ගොඩනැගිල්ලත්, දෙල්ගොඩ නිලසෙවන කාර්යාලය ඉදිකිරීමට යෝජිත ලාවුළුගහවත්ත ඉඩමේ පර්චස් 10ක ඉඩමක් පවරාගැනීමට හා ඒවායේ වටිනාකම තක්සේරුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් නොහැකිවී තිබුණි.	පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති කොටසේ ඉදිකර තිබෙන බැවින් පොදු ඉඩම තක්සේරු කිරීම සිදුකර නොමැති බවද දෙල්ගොඩ නිලසෙවන කාර්යාලය සඳහා යෝජිත ඉඩම මිලදී ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	වත්කම් විධිමත්ව පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 මාර්තු 23 දිනැති අංක 05/2021 දරන ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩමක සේවා පියස් ඉදිකළ යුතු වුවද, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා පියස් 12ක් පෞද්ගලික පරිත්‍යාග ලෙස ලැබුණු ඉඩම්වල ඉදි කර තිබූ අතර මෙම ඉඩම් රජයට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. තවද ගොඩනැගිල්ලේ අයිතිය පමණක් ප්‍රාදේශීය ලේකම් සතු සේවා පියස් 13ක් මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පැවති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක් සඳහා දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් සතු නොවන ඉඩම්වල සේවා පියස් 4ක් ඉදිකර තිබුණි.	2017 හා 2018 වර්ෂයන්හි නිල සෙවණ කාර්යාල ඉදිකිරීම් ආරම්භ කරන ලද කාල සීමාවෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රජය සතු ඉඩම් නොතිබීම හේතුවෙන් අදාළ ආයතනවල එකඟතාවය ලබාගෙන එම තොරතුරු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසුව එම ඉදිකිරීම් සිදු කළ බව සහ ඉඩම් පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව.	සේවා පියස් ඉදිකර ඇති මෙම ඉඩම් රජයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ඉඩම් තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් 2022 වර්ෂයේ සිටම ඉදිරිපත් කර තිබූ අතර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වටිනාකම ලබා දීමට අයිතිය තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කරන ලෙස 2024 අගෝස්තු 05, 2024 ඔක්තෝබර් 16 හා 2024 නොවැම්බර් 01 දිනැති ලිපි මඟින් දිගින් දිගටම දන්වා තිබුණි. ඒ අනුව වසර ගණනාවක් පුරා ඉඩම්වල අයිතිය තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල අපොහොසත් වීම මත ඉඩම් තක්සේරු වටිනාකම් ලබා ගැනීමටත් ඒ අනුව එම වටිනාකම් ගිණුම්ගත කිරීමටත් නොහැකිවී තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව ඉල්ලා සිටිනු ලබන ලේඛන හා පිඹුරුපත්, මිනුන්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තක්සේරු වටිනාකම් ලද විගස ගිණුම්ගත කිරීම් සිදු කරන බවද තවදුරටත් තක්සේරු කිරීමට ඉඩම් 98 පවතින බව.	ඉඩම්වල අයිතිය නිරවුල්කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කර එම ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

4.10 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 ජූලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) (ආ) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී, මුදල් සහකාර සහ සරප් යන නිලධාරීන්ගෙන් සමානව රු.270,561 බැගින් අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අදාළ අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ද 2023 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අලාභය අයකරගැනීමේ නියෝගය පරිදි 2023 දෙසැම්බර් 31 දිනට පෙර රජයට සිදුවී ඇති අලාභය වන රු.1,082,245ක මුදල හා අලාභයෙන් සියයට 25ක් වූ දෙපාර්තමේන්තු ගාස්තුව වංචාවට වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමසේ අයකර ගතයුතු බවට නියෝගකර තිබුණද 2025 අප්‍රේල් 30 දින වන විටත් රු.500,073ක් පමණක් අයකරගෙන තිබුණි.	මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් 2025 අප්‍රේල් 31 වන විට රු.500,073ක මුදලක් අයවී ඇති බව.	අදාළ නිලධාරීන්ගෙන් අලාභය අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබාගත් අයෙකුගේ විශ්‍රාම වැටුප හා ඇයට හිමි වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප එම විශ්‍රාමිකයා මිය යාමෙන් පසු වසර 05 ක් පමණ කාලයක් සඳහා රු.2,696,304 ක් ගෙවා තිබුණි. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2014 මගින් ජීවිත සහතික ලබා නොදෙන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නතර කිරීමට කටයුතු නොකිරීම මත විශ්‍රාම ප්‍රතිලාභියා විසින් ජීවත් වීමේ සහතික ලබා දී නොතිබිය දීත් 2013 සිට 2016 දක්වා වූ වසරවලදී විශ්‍රාම වැටුප් අවිධිමත් ලෙස ගෙවා තිබුණි.	විශ්‍රාමිකයාගේ මිය යෑම තහවුරු කිරීම සිදු වූ ප්‍රමාදය මත වැඩිපුර ගෙවීම සිදු වී ඇත. මෙම වැඩිපුර ගෙවීම අයකර ගැනීම සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොණු කර ඇත. එම නඩුව තවමත් විභාග වන බැවින් මෙම ණය අයකර ගැනීම ප්‍රමාද වී ඇත.	විධිමත් පරීක්ෂණයක් සිදු කර වැඩිපුර ගෙවූ මුදල අයකරගැනීමට කටයුතු කළ යුතුය.

4.11 පාඩු හා හානි

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මිට්ෂුබිසි කැබ් රථයක් 2022 ඔක්තෝබර් 06 දින පස්යාල රත්මලේවත්ත අතිරේක දිස්ත්‍රික් ලේකම් නිවසේ සිට ඉන්ධන ලබා ගැනීමට පස්යාලට පැමිණ නැවත නිවසට යාමේදී රථය රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව දුරකථන රැහැන් කණුවක හා කොන්ක්‍රීට් කණුවක ගැටීමෙන් අනතුරක් සිදු වී තිබුණි. එම අනතුරට අදාළව අළුත්වැඩියා වියදම රු.3,643,350ක් වුවත් රක්ෂණය මගින් ලබාදුන් මුදල රු.3,472,865ක් පමණක් වූයෙන්, තවදුරටත් පැවති නොපියවූ අලාභය අයකරගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි.	කැබ් රථය අලුත්වැඩියා කටයුතු සිදුකර අවසන් අතර සංශෝධිත මූ.රෙ. 104 වාර්තාව ලබා ගැනිම සඳහා සංශෝධිත පරීක්ෂණ මණ්ඩලයක් නම් කර අමාත්‍යාංශ අනුමැතිය ලබා ගෙන ඇති අතර එම කමිටුවේ වාර්තාව ලද පසු ඉදිරියේදී සංශෝධිත මූ.රෙ. 104 වාර්තාව ලබා දීමට නියමිත බව.	විධිමත් පරිදි කටයුතු කර අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය.

4.12 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2018 අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ගෙවීම කරනු ලබන සෑම පුද්ගලයෙකු වෙනුවෙන්ම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වා ගත යුතු වුවත්, අත්තනගල්ල, දොම්පෙ සහ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් පිළිවෙලින් 05,10 සහ 04 දෙනෙකු වෙනුවෙන් තාවකාලික ලිපිගොනු සකස් කර ගෙවීම් කර තිබුණද ඒ සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියක් 2025 මැයි වනවිටත් ලැබී නොතිබුණි. තවද, විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් නොමැති විශ්‍රාමිකයන් 02දෙනකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.704,246ක් බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි.	අත්තනගල්ල සහ දොම්පෙ කාර්යාලවල තාවකාලික ලිපිගොනු අනුමැතිය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බවද, මේ වනතුරු පිළිතුරු ලැබී නොමැති බව හා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාවකාලික ගොනු අනුමත කර ගැනීමට අවශ්‍ය ලේඛන සපයා ගැනීමට නොහැකි වී ඇති බව හා ලිපිගොනු නොමැති දෙදෙනා සම්බන්ධව තවදුරටත් අවශ්‍ය තොරතුරු අදාළ ආයතනවලින් කැඳවා ඇති බව.	තාවකාලික විශ්‍රාම වැටුප් ලිපිගොනු සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	2005 වර්ෂයේදී හෝ ඊට ආසන්න කාලයේදී මීරිගම සහ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරමින් සිටියදී ව්‍යාජ විශ්‍රාම වැටුප් සැකසීම හා කූට ලේඛන සැකසීම මඟින් රු.5,608,336ක් හෝ ඊට ආසන්න මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් 2008 නිලධාරියෙකු වැඩ තහනම් කර තිබුණු අතර 2023 ඔක්තෝබර් 16 දින කොන්දේසිවලට යටත්ව නැවත සේවයේ පිහිටුවා තිබුණි. 2023 ජූනි 02දින විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කර තිබූ අතර එම විනය පරීක්ෂණය මෙහෙයවන නිලධාරියා විසින් සපයා ඇති සාක්ෂි හා ලේඛන චෝදනාව ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බව දක්වා තිබූ හෙයින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු අධිකරණ කටයුතු සඳහා ලබා දී ඇති බැවින් අධිකරණයෙන් තොරතුරු කැඳවා තිබුණි. එහෙත් 2008 වර්ෂයේදී සිදු වූ මෙම වංචාවට අදාළ වරදකරුවන් හඳුනාගෙන රජයට සිදු වූ අලාභය අය කර ගැනීමට 2025 මැයි මාසය වන විටත් හැකි වී නොතිබුණි.	සාක්ෂි ලේඛන ලබාගැනීම සඳහා අමාත්‍යාංශයේ නීති අංශයේ මැදිහත්වීම ලබාගැනීම සඳහා 2024/10/16 දින ලිපියක් යොමුකර ඇතත් පිළිතුරු නොලැබුණු හෙයින් නැවත ඒ පිළිබඳව විමසා 2025/04/28 දිනැතිව ලිපියක් යොමුකර ඇති බව.	වරදකරුවන් හඳුනාගෙන රජයට සිදු වූ අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ විශ්‍රාමිකයකු මිය යාමෙන් පසු විශ්‍රාම වැටුප් ගෙවීම නතර නොකිරීම හේතුවෙන් වැඩිපුර රු.181,901ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් 2024 අගෝස්තු 20 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ කමිටුව පත් කර තිබුණද 2025 මැයි මාසය වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	පත්කරන ලද කමිටුව විසින් අදාල වාර්තාව සකස්කර දීමට නියමිතව ඇති බව.	එහි නිර්දේශ අනුව කටයුතු කිරීමටත් අප්‍රමාදව වාර්තාව ලබා ගෙන සහ වැඩිපුර ගෙවනලද මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම.
(ඇ)	2022 සැප්තැම්බර් 08 දින කළමනාකරණ සේවා නිලධාරිනියක වෙත නිකුත් කරන ලද චෝදනා පත්‍රය අනුව එම නිලධාරිනිය විසින් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටියදී තොරතුරු කූට ලෙස වෙනස් කරමින් දළ වශයෙන් රු.1,360,600ක රජයේ මුදලක් අයථා ලෙස පරිහරණය කර තිබුණි. මෙම වංචාව හේතුවෙන් 2020 ජූනි 23 දින සිට මෙම නිලධාරිනිය වැඩ තහනමකට ලක්	විධිමත් විනය පරීක්ෂණය මෙතෙක් අවසන් වී නොමැති බව.	විධිමත් විනය පරීක්ෂණය කඩිනමින් අවසන් කර අලාභය අයකර ගැනීමත්, අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත් කටයුතු සිදුකළ යුතුය.

	වී සිටින අතර විධිමත් විනය පරීක්ෂණය 2022 දෙසැම්බර් 30 දින ආරම්භ කර තිබුණ ද 2025 මැයි මාසය වන විටත් විධිමත් විනය පරික්ෂණය අවසන් කර අලාභය හඳුනාගෙන, අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.		
(ඉ)	කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයෙකුගේ මරණය 2016 පෙබරවාරි 10 දින සිදු වී තිබූ අතර එදින සිට විශ්‍රාම වැටුප් ගෙවීම නතරකළ යුතු වුවද, එසේ නොකිරීම හේතුවෙන් 2018 ජූලි 31 දින දක්වා රු.787,576ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. මේ පිලිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයක් පවත්වා 2024 අගෝස්තු 28 දින ඉදිරිපත් කරන ලද වාර්තාව අසම්පූර්ණ බැවින් නැවත විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස එම කමිටුවට 2024 දෙසැම්බර් 03 දින දන්වා තිබුණි. කෙසේ වුවත් වැඩිපුර ගෙවීම සිදුවී වර්ෂ 05 කට අධික කාලයක් ගත වී ඇතත්, වැඩිපුර ගෙවූ එම මුදලින් රු.621,576 ක් තව දුරටත් අයකර ගත යුතුව පැවතුණි	මු.රෙ 104 පරිදි අදාල වාර්තාව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇති බව.	විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළයුතු අතර වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකරගැනීමටත්, අදාළ පාර්ශව වෙත පියවර ගැනීමත් කටයුතු කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව තිරසාර සංවර්ධන අරමුණු 11ක් හඳුනාගෙන තිබුණු අතර, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා සංවර්ධන ඉලක්ක 20ක් ඉදිරිපත් කර තිබුණි. ඉන් ඉලක්ක 11කට අදාළව ප්‍රගතිය සියයට 50කට අඩු මට්ටමක පැවතුණි.	විගණන නිරීක්ෂණය පිළිගනිමි.	හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉටුකරගැනීමට අදාළ ඉලක්ක සපුරා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.

6. යහපාලනය

6.1 විගණන හා කළමනාකරණ කමිටුව

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අගෝස්තු 07 දිනැති අංක 06/2018 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ එක් කමිටු රැස්වීමක් වූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් කමිටු රැස්වීම් 02ක්ද, එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කමිටු රැස්වීම් 03ක්ද පවත්වා තිබු බව නිරීක්ෂණය විය.	චක්‍රලේඛය අනුව කාර්තුවක් සඳහා එක් ප්‍රාදේශීය විගණන කළමනාකරණ කමිටුවක් පැවැත්විය යුතු වුවද පළමු කාර්තුව තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු නොමැතිවීම නිසාද, තෙවන හා සිව් වන කාර්තුවලදී මැතිවරණ කටයුතු හේතුවෙන්ද ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සිදුකළ නොහැකි වූ අතර ඉදිරියේදී අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති බව.	චක්‍රලේඛය අනුව වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතුය.

7. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සඳහා 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල 3414ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 3171ක්ද තනතුරු කාණ්ඩ 16 අදාළව පුරප්පාඩු 279 ක් සහ තනතුරු කාණ්ඩ 02 කට අදාළව 36 දෙනෙකු අතිරික්තවද පැවතුණි.	පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇති බව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවතින පුරප්පාඩු පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති බව සහ අතිරික්ත නිලධාරීන් අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු අනුමත කර ගැනීමට යටත්ව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් යෝජිත සංවර්ධන නිලධාරීන් 64ක් ඇතුළත් වන බව.	කාර්ය මණ්ඩල අවශ්‍යතාවය විශ්ලේෂණය කර අත්‍යාවශ්‍යම පුරප්පාඩු පමණක් පිරවීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩල තුලනය කිරීමටත් කටයුතු කළ යුතුය.

(ආ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එකම සේවා ස්ථානයේ වසර 05 කට වඩා සේවය කර ඇති නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි නිලධාරීන් 587 දෙනෙකු වසර 06 ත් 31 ත් අතර, සහ වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තුවලින් අනුයුක්ත කළ නිලධාරීන් 126 දෙනෙකු වසර 06 ත් 26 ත් අතර කාලයක් එම කාර්යාලයේම සේවයේ යෙදවා තිබුණි.	අදාළ නාමලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක ජනරාල් වෙත හා රාජ්‍ය පරිපාලන අමාත්‍යංශ ලේකම් වෙත වාර්ෂිකව ඉදිරිපත් කරන අතර එම නියෝග ප්‍රකාරව කටයුතු කරන බව.	චක්‍රලේඛ ප්‍රකාරව එකම සේවා ස්ථානයේ වසර 05 කට වඩා සේවය කර ඇති නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ලබා දිය යුතුය.
(ඇ)	ආයතන සංග්‍රහයේ (ii) වන පරිච්ජේදයේ 13(3) ජේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් බවත්, තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්කිරීම නොපමාව කළ යුතු බවත් සඳහන් වුවද වැඩබැලීමේ පත්වීම් සිදුකළ නිලධාරීන් 78 දෙනෙකුගෙන්, නිලධාරීන් 74 දෙනෙකු මාස 03 සිට අවු.06 අතර කාල පරාසයක් වැඩබැලීමේ රාජකාරියේ නියුතුව තිබුණි.	නව බඳවාගැනීම් මේ වන විට සිදු නොවන හෙයින් එම වැඩබැලීමේ පත්වීම් ලබාදීමට සිදුව ඇති බව.	ආයතන සංග්‍රහය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.